ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2008 / 2009

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය – **LWU 1201**

කාලය – පැය 03 යි

---

දිනය : **2009. 03. 20** වේලාව: පෙ. ව. **9.30** - ප. ව. **12.30**

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

01. අමරසිංහ සහ සුමනපාල යන රාජ්‍ය සේවකයන් දෙදෙනා විසින් සැල්විනියා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරමින් චෝදනා ලෙස කරුණු ඉදිරිපත් කර සිටිනුයේ, "පොදු කාර්යයක්" සඳහා වෙන් කරන ලද රජයේ ඉඩමක්, 'විනෝද උයන' නම් වූ පුද්ගලික ක්‍රීඩා උද්‍යානයක් සෑදීම සඳහා නීතිවිරෝධී ලෙස පවරා දීමට සැල්විනියාවේ හිටපු ජනාධිපති රොබට් රවුන්ඩෝ කටයුතු කර ඇති බවයි. එකී ගනුදෙනුව සඳහා තමාගේ සබඳතාවය ඉතා අවම බවත්, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා හා මුදල් අමාත්‍යවරයා වශයෙන් ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි අපේක්ෂා කරන කාර්යයට පමණක් එය සීමා වූයේය යන කරුණ මත පදනම්ව රොබට් රවුන්ඩෝ එම චෝදනාව ප්‍රතික්ෂේප කරයි. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කරන මාරින්ඩෝ මහතා හට තමා විසින් මෙම කර්තව්‍ය පවරා දුන් බවත් සහ මාරින්ඩෝ විසින් එසේ පවරා දුන් බලතල අනිසි ලෙස භාවිතා කොට ඇති බවත් ඔහු වැඩිදුරටත් කියා සිටියේය. කෙසේවුවද, මහජන නියෝජිතයන්ගේ යුතුකම්වලට අනුකූලවන ආකාරයට හැසිරීමට රොබට් රවුන්ඩෝ අසමත් වී ඇති බව නඩු විභාගයකින් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය. ජනාධිපති බලතල, ජනතාව වෙත ඉටුකිරීමට බැඳී ඇති අයුරින් නීතියේ ආධිපත්‍යය නම් මූලධර්මයට අනුකූලව ක්‍රියාත්මක කළයුතු බවත්, එමෙන්ම තමාගේ හෘදය සාක්ෂියට සහ අවංකත්වයේ හැඟීමට අනුකූලව ඉටු කළ යුතු බවත් අධිකරණය වැඩිදුරටත් තීරණය කළේය.

නීතියේ ආධිපත්‍යය යන මූලධර්මය ඇසුරින් ඉහත තීන්දුව විවේචනාත්මකව විභාග කරන්න. සැල්විනියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමානය යන පදනම මත මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයන්න.

02. (අ) ශ්‍රී ලංකාවේ නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විකාශනයේ ඉතිහාසය විශ්ලේෂණය කරන්න. 1802 සිට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැනවීම දක්වා වූ කාල පරිච්ඡේදය ඔබගේ විග්‍රහයෙන් ආවරණය විය යුතුය.

(ආ) "සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික වශයෙන්ම 'වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ' ආණ්ඩු ක්‍රමයක් යෝජනා කරයි. අතීතයේ බ්‍රිතාන්‍ය යටත් විජිත ලෙස පැවති රාජ්‍යයයන් පනවන ලද, සියලුම ස්වාධීන ජනත් සහ ඔවුන්ගේ නව නිදහස් ව්‍යවස්ථාවන් දක්වාද, මෙම ආකෘතියේ ඇති ඇතැම් සුවිශේෂී ලක්ෂණ ව්‍යාප්තව ඇත."

Lakshman Marasinghe, *The Evolution of Constitution Governance in Sri Lanka*, 1st Edn. (2007) p.106

ඉහත ප්‍රකාශය ඇසුරින් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති කැපී පෙනෙන ලක්ෂණයන් විභාග කරන්න. උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන් සාකච්ඡා කරමින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

03. (අ) යටත් විජිතමය ආකෘතියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ගෙන් මිදීයාමේ ක්‍රියාවලියේ ආරම්භයක් වශයෙන්, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආකෘතිය සැලකිය හැකිය. එක්සත් රාජධානිය සමග ශ්‍රී ලංකාවේ පැවති පෙර තිබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සබඳතා වලින් සම්පූර්ණ කැඩීයාමද, මෙම වෙනස්වීම තුළ සිදුවිය.

ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන් සහ නඩු තීරණ ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න. ඔබගේ විග්‍රහය වෙනත් අධිකරණ පද්ධතීන් දෙකක් සමග සංසන්දනය කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(ආ) නීති විද්‍යාලයට ලබන වසරේ ඇතුලත් වීමට අපේක්ෂා කරන නිමල්ට රොසාවා රාජ්‍යයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ලියැවුණු ලිපියක් කියවීමේදී, අපැහැදිලි සැක සහිත ස්ථාන කිහිපයක් මතුවිය. එම ලිපියේ තිබූ පහත සඳහන් වගන්තීන් ඔහුට තේරුම් ගත නොහැකිය.

- "රොසාවා රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව **ලිඛිත, අනම්‍ය,** හා **ප්‍රදානය කල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි**".
- "රොසාවා රාජ්‍යය තම වත්මන් **ඒකීය** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව **ෆෙඩරල්** ව්‍යුහයකට පරිවර්තනය කිරීමට අපේක්ෂා කරයි".
- "රොසාවා රජය **ප්‍රධාන පාලන අංග තුනකින්** සමන්විත වේ".

මෙම යෙදුම් නිමල්ට පැහැදිලි කර දීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

04. 2007 වර්ෂයේදී කවීනියා රාජ්‍යය, මරීනියා රාජ්‍යයෙන් නිදහස අත්කරගන්නා ලදි. කවීනියා රාජ්‍යය සිය ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීමේ කර්තව්‍යයෙහි නියැලී සිටී. අධිකරණයේ ස්වාධීනත්වයට අදාල සවිස්තරාත්මක ප්‍රතිපාදනයන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමන්විත වන්නේ නම්, කවීනියා හි ජනතාවගේ නිදහස සහ සමානාත්මතාවය උපරිම වශයෙන් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට හැකිය යන මතය කවීනියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක සභාව දැඩි ලෙස දරයි.

ඔබ මෙම අදහස සමග එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරමින්, ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් උදාහරණ ගෙනහැර දක්වමින් එය පැහැදිලි කරන්න.

05. (අ) "... අනාගත පාර්ලිමේන්තු වලට ව්‍යවස්ථාදායක ආධිපත්‍යය භුක්ති විඳිය නොහැකි පරිදි, නව පියවර සකස් කිරීමද, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක අධිකාරී බලයට ඇතුළත්ය. පුද්ගලයාගේ මූලික අයිතිවාසිකම් සහ මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්මයන්ට පටහැනි ව්‍යවස්ථාවන්ට එරෙහිව ප්‍රමාණවත් ආරක්ෂාවක් දේශපාලන පද්ධතිය විසින් ලබාදෙන බව පෙන්නුම් කළ හැකි නම් ව්‍යවස්ථාදායක ආධිපත්‍ය යන සංකල්පය පැවතිය යුතුය යන අදහස ශක්තිමත් කළ හැකිවේ".

A.W. Bradley and K.D. Ewing, *Constitutional and Administrative Law*, 12th Edn. (1997) p. 85.

පාර්ලිමේන්තු ආධිපත්‍ය පිළිබඳ සංකල්පය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. ඔබ උචිත යැයි අදහස් කරන අනෙකුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්ම ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කළ හැකිය.

(ආ) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වන රටක පුරවැසියෙකුට, පීඩාකාරී, සදොස් රජයකට එරෙහිව විවිධ වූ ආරක්ෂාවන් ඇත. මෙම එක් එක් ප්‍රතිකර්ම විශේෂ අවස්ථාවන් සඳහා ඵලදායී වන නමුත් ඒ සියල්ලටම සීමාවන් පවතී. ඒවා අතරින් ඔම්බුඩ්ස්මන් ධූරය පුරවැසියන් ආරක්ෂා කිරීමට ඵලදායී ලෙස දායක වන එක්

ආරක්ෂාකාරී පිළිවෙතකි. ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔම්බුඩ්ස්මන් ප්‍රතිකර්මය වඩාත් අර්ථාන්විත කිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනාවන් කවරේද?

06. සහල් වල මිල ඉහළ යාම හේතුවෙන්, මාස 08 කට අධික කාලයක සිට තිනිඩා රාජ්‍යය ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. මිල ඉහළ යාම සම්බන්ධව රජය දක්වන හේතුව පදනම් වී ඇත්තේ, ලෝක වෙළඳපොලේ සහල් මිල හදිසියේ ඉහළ යාමයි. නොබෝදා ලෝක වෙළඳපොලේ සහල් මිල 70% කට වැඩි ප්‍රතිශතයකින් පහත වැටුණි. මහජනතාවගෙන් එල්ල වූ විරෝධතා මාධ්‍යයේ වුවද, තිනිඩා රජය මේ පිළිබඳව නිහඬව සිටි අතර සහල් මිල නොවෙනස්ව පැවතුනි. ඒ අතර තුරදී තිනිඩා රාජ්‍යයේ විරුද්ධ දේශපාලන පක්ෂයක සාමාජිකයෙකු වන ජීවන්ති මෙනවිය විසින් සහල් මිල පිළිබඳව අභියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරන ලදී. නඩු විභාගයෙන් අනතුරුව සහල් මිල වහාම ක්‍රියාත්මක වන පරිදි පහත හෙලන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රජයට නියෝග කරන ලදී. කෙසේ වුවද, සහල් මිල පහත හෙලීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය නිකුත් කළ තීන්දුව බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කරමින් කැබිනට් මණ්ඩලය ප්‍රකාශ කර සිටියේ, මෙම කාරණාව සම්බන්ධව අධිකරණය ලබාදුන් තීන්දුව රජය විසින් තවදුරටත් ක්‍රියාත්මක නොකරන බවයි.

නීති උපාධි අපේක්ෂකයන් වන ක්‍රිෂාන්ත් සහ නදීෂා ඉහත තත්වයන් පිළිබඳව සාකච්ඡා කරමින් සිටිති. වෙළඳ භාණ්ඩ වල මිල නියම කිරීම රජයක විධායකයේ කාර්යයක් වන බවට ක්‍රිෂාන්ත් අදහස් කරයි. කෙසේ වුවද නදීෂා තර්ක කරනුයේ එකී විධායක බලය අත්තනෝමතික හා අතාර්කිකව නොව, යුක්තිසහගත සහ සාධාරණ ලෙස ක්‍රියාත්මක කරන්නේද යන්න විනිශ්චය කිරීමේ බලය අධිකරණය සතු වන බවයි.

උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්මයන් ඇසුරින් ඉහත විවාදිත කාරණාවන්හි නිරවද්‍යතාවය විශ්ලේෂණය කරන්න. උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන් සහ නඩු තීන්දු ඇසුරින් පිළිතුර තහවුරු කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. තිනිඩා හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරන්න.

07. නීති උපාධිය සඳහා අධ්‍යයන කටයුතු වල නිරත වන ශිෂ්‍යයකු වශයෙන්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, විධායක ජනාධිපතිවරයා යන මාතෘකාව පිළිබඳව දීර්ඝ වාර්තාවක් පිළියෙල කරන ලෙස ඔබට දක්වා ඇත . ජනාධිපති ධුරය කෙරෙහි සීමා රහිත / අසීමිත බලයක් ප්‍රදානය කිරීමට එරෙහි අදහස් සාකච්ඡා කිරීමද ඔබගෙන් අපේක්ෂා කෙරේ. උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ නඩු තීරණ ආධාර කොට ගනිමින් ඔබගේ වාර්තාව තහවුරු කළ යුතුය.

08. පහත ඒවායෙන් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

(අ) ජනමත විචාරණය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.

(ඇ) සමාජ සුභ සාධන නඩුකර.

හිමිකම් ඇවිරිණි
************